# ගුරු අම්මා



අමෝදිනී සෙනවීර



කතාව - අමෝදිනි සෙනවීර

චිත්‍ර - චේතනා ජයසිංහ

කතෘ ප්‍රකාශයකි.

**ISBN** අංකය - 978-624-208-032-1

මුද්‍රණය

**'The PRESS'**

කොටුගොඩැල්ල වීදිය,

මහනුවර

# පිදුම

කිංස්වුඩ් විදුහල් මාතාව වෙත පිය නැගූ මුල් ම දින..
(1999 ජනවාරි.)
මගේ පුතුගේ
ආදරණීය ගුරුතුමියට
පුදන්නට..
මා විසින්..
ලියූ පැදිපෙළයි මේ.

ගුරු අම්මා

වසර 24ක් පුරා
සුරැකිව බොහෝ කල් තබාගත්
ඒ කහපැහැ ගැසුණු පත් ඉරු,
චිත්‍ර පත්
මහාමායා ප්‍රාථමිකයේ මගේ ගුරු සොයුරියන්ට
ඇස ගැටෙනුයේ,
එය පොතක් ලෙස එළිදකින්නට තිබුණු හින්දා ම විය හැකිය..
හිමාල් ශංකන විජේකෝන්
ම'පුතුදැන් ලොකු මහතෙකි.
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා උපාධිය ලබා,
ආචාර්ය උපාධියට ඉගෙනුම පිණිස..
ජර්මනියට ගොස් ය.
පුතු මා ළඟ නැති පාළුව මට තදින් දැනේ.
මිනිස්කමින් වැඩී,
ලොව ම දිනා..
නුඹ එනතෙක්..
මම මඟ බලමි.
මගේ හිත් අගිස්සේ කිරි සුවඳ තැවරූ නුඹටයි මේ පිදුම
සිසු දිවිය පුරාවට ම නුඹහට සෙනෙහස දුන්
ගුරු දෙවිවරුනි..
නුඹටයි ගුරු අම්මා
පිදුම..

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# ස්තූතිය

මගේ දිවිය.

නිති නේක රසින් තබනා,

මගේ ආදරණීය..

සැමියාට..

පුතුන් දෙදෙනාට..

දෝණියට..

බොහෝ කලකට ඉහත දී මෙහි චිත්‍ර ඇඳ දුන් චේතනා ජයසිංහ දියණියට.

(ඇය ද අද ගුරුවරියකි)

මහාමායා බාලිකාවේ..

විදුහල්පතිතුමියන්ලා ප්‍රමුඛ..

ගුරු සොයුරු සොයුරියන්ට..

**වසර 24 කට පෙර ලියූ කහ පැහැ ගැහුණු**

**මෙම කවි පත් ඉරු, ගැන අසා**

**බලෙන් ම එය මගෙන් ගෙන්වා ගෙන,**

**අපූරු කවි ටික යැයි කියමින්**

**උදම් අනා,**

**සියල්ලන්ට ම පෙන්වා**

**මටත් රහසේ ම ඒවා රැගෙන ගොස්**

**පොතක් ලෙස සකස් කොට,**

**විශ්‍රාම දිවිය අභියස සිටිනා**

**මට තිළිණ කළ**

**මහාමායා ප්‍රාථමිකයේ**

**ආදරණීය සමන්මලී ගුරු දියණියට...**

**අකුරු උගැන්මට ළඟ දැවටෙනා**

**සිසු දරු දැරියන් සෙනෙහසින් රකිනා..**

**සියලු ගුරු දෙව්වරුන්ට..**

**(මම ද ඉන් එක් අයෙක්මි)**

**මගේ හදපිරි ස්තූතිය හිමිවිය යුතුය .....**

අමෝදිනී සෙනවිර
(ඉංග්‍රීසි විෂය භාර ආචාරිණී)
මහාමායා බාලිකා විදුහල
ප්‍රාථමික අංශය
2023.12.14

පුංචි දුවේ පුංචි පුතේ මේ අහගන්න
හිතත් අරන් පොතත් අරන් මෙහාට එන්න
මගේ ළඟින් වාඩිවෙලා අකුරු ලියන්න
ඔබ කියනවා මට ඇහෙනවා මටත් කියන්න



මල් ඔසරිය ඇඳ ඇතින් එනවා ජේනවා

සිනාසිසී අප දෙසට ම එනවා ජේනවා

දුවේ පුතේ කියලා අප සතුටු කරනවා


අපේ හදේ දහසක් මල් වැල් පිදෙනවා



පොත් මිටියක් තුරුළු කරන් එන්නේ ඉක්මනින්
සිනාසිසී අප දිහාට එන්නේ දයාවෙන්
මගේ පුතේ මගේ දුවේ කිව්වේ ආදරෙන්
ගුරු අම්මේ ඔබ එනතුරු ඉන්නේ මඟ බලන්



බොරුවට තරවටු කරලා අප බය කෙරුවා
අප බය බව දැනගත්ත ම ඔබ දුක්වූවා
නෑ අම්මේ කරදරයක් දෙන්න අප සිතා
ඔබ හින්දයි අප දිනුවේ මේ ලොව සැමදා



මුළු පන්තිය ඔප් නංවන අම්මා කවුරුදෝ
අපේ සිතට සතුට ගෙනෙන අම්මා කවුරුදෝ
ගීත කතා කියලා දෙන අම්මා කවුරුදෝ
මගේ අම්මගේ ගුරු අම්මගේ වෙනස කවුරුදෝ



අකුරු ලියා කියලා දෙන අම්මා කවුරුදෝ
කවි සීපද කියලා දෙන අම්මා කවුරුදෝ
පුංචි කතා කියලා දෙන අම්මා කවුරුදෝ
මා උගතෙක් කරලා දෙන අම්මා කවුරුදෝ



බත් කැව්වේ නැති හින්දයි ඔබ වෙනස් වුණෝ
නාවන්නේ නැති හින්දයි ඔබ වෙනස් වුණෝ
නිදි කෙරුවේ නැති හින්දයි ඔබ වෙනස් වුණෝ
මගේ අම්මයි ගුරු අම්මයි නෑ වෙනස් වුණෝ



පන්තිය පාළුයි අම්මේ ඔබ නැති හින්දා
මේසය ඔරවයි අම්මේ ඔබ නැති හින්දා
ගුරු පුටුවත් බිම බලාන ඔබ නැති හින්දා
නිවාඩුවක් ගන්න එපා අපි පොඩි හින්දා



පාසල මගේ ගෙදර වුණෝ ඔබේ සෙනෙහසින්
පාඩම මට රස වූයේ ඔබේ සිනාවෙන්
නුවණැස මට වැඩිවූයේ ඔබේ දයාවෙන්
මම හොඳ ළමයෙක් වූයේ ඔබේ ඔවදනින්



මේ මුළු ලොව මා දකින්නේ ඔබේ නෙතු අගින්
මේ මුළු ලොව මා අසන්නෙ ඔබේ දෙසවනින්
මේ ලොව මා රජ කරන්නේ ඔබේ දිරි බලෙන්
මේ මුළු ලොව මා දිනන්නේ ඔබේ ශක්තියෙන්



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01